පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

සතිය - 34

විෂය -නර්තනය

Prepared by – M.B.I.G.kumari
R/Sumana Balika Vidyalaya

ශ්‍රේණිය - 13

නිපුණතාව 01 ඃ නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.5 ඃ වෙනත් සම්ප්‍රදායවලට අයත් නර්තන අංග දෙකක් ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම් 1.5 ඃ මංගලම්, ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය නර්තන අංග ඉදිරිපත් කරමු.

- <u>නිවැරදි පිළිතුරු තෝරන්න.</u>

1. සබරගමු නර්තන සම්ප්‍රදායේ ආධුනිකයකු නටනු ලබන ප්‍රථම නර්තනාංගය,

(i). සිංදු මාත්‍රය (ii). ශුද්ධ මාත්‍රය (iii). මුල් මාත්‍රය (iv). ආවැන්දුම

2. මුල් මාත්‍රය නර්තනය කරනුයේ,

(i).මාත්‍රා 2+2+4 තුන්තිතට (ii). මාත්‍රා 2+2+2+4+4පස්තිතට

(iii). මාත්‍රා 2+2+2+3+3 පස්තිතට (iv). මාත්‍රා 3+4 දෙතිතට

3. ශාන්ති කර්ම ක්ෂේත්‍රයේ දී දේව ප්‍රණාම දැක්වීමට කවිතාල වශයෙන් ...........රඟ දක්වයි,

(i).සබරගමු - යහන් දැක්ම (ii). උඩරට - ආවැන්දුම (iii). පහතරට - ශුද්ධ මාත්‍රය (iv). සබරගමු - මුල් මාත්‍රය

4. ශුද්ධ මාත්‍රා නැටුම දේව ශාන්ති කර්ම හා සම්බන්ධ වන්නේ,

(i). බෙන්තර ශාන්ති කර්මය ආරම්භයේ දී ගමන් පදයක් ලෙස යොදා ගැනීම නිසයි.

(ii). සබරගමුවේ ග්‍රහ ශාන්තියේ අවසානයේ සෙත් ශාන්ති කිරීමේ දී පදයක් ලෙස ශුද්ධ මාත්‍රයේ පදයක් වාදනය කිරීම නිසයි.

(iii). මාතර ශාන්තිකර්ම අවසානයේ පිංබෙර වැයීමේ දී යොදා ගැනීම නිසයි.

(iv). මාතර ශාන්තිකර්ම ආරම්භයේ දී කප රැගෙන එන පෙරහැර ගමන් ආරම්භක පදය ලෙස ශුද්ධ මාත්‍රා පදයක් යොදා ගැනීම නිසයි.

5. මුල් මාත්‍රය නර්තනයේ ව්‍යුහයේ අනුපිළිවෙළ ලෙස ,

1. තානම,කවිය,කලාසම් වට්ටම,කලාසම හා අඩව්ව 2. තානම,කවිය, කලාසම, කලාසම් වට්ටම, හා අඩව්ව

3. තානම,කවිය,තානම,කවිය,කලාසම හා අඩව්ව 4. තානම,කවිය, ඉරට්ටිය හා අඩව්ව

- <u>හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .</u>

6. මුල් මාත්‍රය ......................................................................නමින් ද හඳුන්වයි.

7. උඩරට ......................................................................නැටුමේ තාල රූපයට මුල් මාත්‍රය ද නටනු ලබයි.

8. මෙලෙසින් මල් මද දේවියේ.......කවිය ..............................................................දෙතිතට නටයි.

9. මූලික හස්ත චලන හුරුවීමත්, සමඟ මණ්ඩියට සිට ........................................ ආකාරයක චලන පුහුණුවක් මුල් මාත්‍රය නැටීමෙන් සිදුවේ.

10. වර්තමානයේ ශුද්ධ මාත්‍රා නැටුම ..................................නැටුමක් ලෙස ද විකාශනය වී ඇත.

- <u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>

11. මුල් මාත්‍රය හා ශුද්ධ මාත්‍රයට අයත් කවි නිවැරදි ව තාල තබමින් ගායනා කරන්න.

12. අදාළ තිත් රූපයන්ට අනුව මුල් මාත්‍රය හා ශුද්ධ මාත්‍රය ප්‍රස්තාර ගත කරන්න.

13. මුල් මාත්‍රය හා ශුද්ධ මාත්‍රය තාලානුකූලව නර්තනය කරන්න .

14.සම්ප්‍රදාය ත්‍රිත්වයෙහි චලන හා මූලික අංගහාර අතර ඇති සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.